# "අපි අපිම" අරමුදල
# තුලාව සංසදය
# නීති පීඨය
# කොළඹ විශ්වවිද්‍යාලය

## හැඳින්වීම

කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨයේ නිල ශිෂ්‍ය ප්‍රකාශනය වන "තුලාව", පීඨ මණ්ඩල අනුමැතියට යටත්ව විශ්වවිද්‍යාලය සනාථන සභාව විසින් සම්මත කරන ලද ව්‍යවස්ථාවක් අනුව පිහිට වූ ස්වාධීන ශිෂ්‍ය සංවිධානයකි. නීති පීඨ විද්‍යාර්ථීන්ගේ අධ්‍යයන අරමුණු ප්‍රමිතිගතව ඉහළ නැංවීමේ මූලික පරමාර්ථයෙන් යුක්තව 2016 වසරේ සිට "තුලාව" ක්‍රියාත්මක වන අතර ඊට අමතරව ශිෂ්‍ය කුසලතා සඳහා වේදිකාවක් නිර්මාණය කිරීමට සහ ශිෂ්‍ය සුබසාධනය උදෙසා හැකි පමණ උත්සාහයක් ගනිමින් සිටී. එම ව්‍යායාමයේ එක් ප්‍රතිඵලයක් ලෙස "අපි අපිම" අරමුදල හැඳින්විය හැකිය.

නීති පීඨ ශිෂ්‍යයන්ගේ සුබසාධනය අරමුණු කරගත් "අපි අපිම" අරමුදල නිර්මාණය වන්නේ "අත් ගොඩක - හිත් බැම්ම" යන තේමාවෙන් යුක්තව 2020 වසරේ දී පැවැත්වූ "අපි අපිම" ප්‍රසංගයට සමගාමීව ය. නීති පීඨ විද්‍යාර්ථීන්ගේ කලා කුසලතා වලට මනා තෝතැන්නක් එළිපෙහෙළි කරමින් සහ අධ්‍යයන පීඩනයෙන් තරමක අස්වැසිල්ලක් ලබනු වස් මෙම ප්‍රසංගය උපකාරී වනවා නො අනුමාන ය. දිවයිනේ සතර දෙසින් නා නා විධ තරාතිරමෙන් යුක්තව අගනුවර නීති වනපොත් කරන්නට පැමිණෙන විද්‍යාර්ථීන්ට ඔවුන්ගේ පෞද්ගලික මට්ටමින් පැන නැගෙන ගැටළු විසඳා ගැනීම සෑහෙන පමණ දුෂ්කර කර්තව්‍යයක් බව නොකිව මනා ය. එකී දුෂ්කර ම කාර්තුවලට ශක්තිමත්ව මුහුණ දීම සඳහා සහෝදර විද්‍යාර්ථීන්ට සවියක් වීමේ සද්භාවී චේතනාවෙන් "අපි අපිම" ප්‍රසංගයෙන් ලැබෙන මූල්‍යමය ලාභය උපයෝගී කරගෙන "අපි අපිම" අරමුදල නිර්මාණය කර තිබේ.

මෙම අරමුදල නීති පීඨයේ ඉදිරි පරපුර සඳහා වර්ධනය කරමින් සුරක්ෂිත කර ගැනීම පීඨයේ තත්කාලීන සහෝදරත්වයට පැවරෙන වගකීමක් වන අතර මෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව මීළඟ වගන්තිවල සඳහන් වනු ඇත.

## ක්‍රියාකාරීත්වය

- "අපි අපිම අරමුදල" ක්‍රියාත්මක වන්නේ නීති පීඨ නිල ශිෂ්‍ය ප්‍රකාශනය වන තුලාව සංසදයේ ව්‍යාපෘතියක් ලෙසයි.

- අරමුදලේ සියලුම මූල්‍යමය හා/හෝ මූල්‍යමය නොවන ගනුදෙනු සම්බන්ධයෙන් හා/හෝ ඊට අනුෂාංගික වෙනත් ඕනෑම ක්‍රියාකාරීත්වයක් සම්බන්ධයෙන් තුලාව සංසදයේ සභාපති හා කණිෂ්ඨ භාණ්ඩාගාරික; එහි ජ්‍යේෂ්ඨ භාණ්ඩාගාරික සමග එක්ව කටයුතු කළ යුතුය. සෑම කාර්යයක් සම්බන්ධයෙන් ම තුලාව ව්‍යවස්ථාව බලාත්මක ලියවිල්ල ලෙස සැලකිය යුතුය.

- "අපි අපිම ප්‍රසංගය" අරමුදලේ ප්‍රධාන මූල්‍ය මූලාශ්‍රය වන අතර ඊට අමතරව පිළිගත හැකි ඕනෑම මූලාශ්‍රයකින් ලැබෙන ප්‍රධානයන්ගෙන් අරමුදල සමන්විත වේ.

- අරමුදල; "තුලාව සංසදය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය" නාමයෙන් මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ පවත්වාගෙන යන 086200150028125 දරණ ගිණුම් අංකයෙන් ක්‍රියාත්මක වේ.

- අරමුදලෙන් ප්‍රතිලාභ ලැබිය හැක්කේ කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨයේ විද්‍යාර්ථීන්ට සහ/හෝ අවස්ථානුකූලව ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයන්ට පමණි. ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරය මෙහි පහත දැක්වෙන ආකාරයට මිස වෙනත් කිසිදු ආකාරයට සිදු නොවේ.

- අරමුදලේ නාමයෙන්, නමුත් මේ ගිණුම් අංකය හැර වෙනත් කිසිදු බැංකු ගිණුමක් සමඟ කෙරෙන ගනුදෙනුවක් සම්බන්ධයෙන් තුලාව සංසදය වග නොකියන බව සැලකිය යුතුය.

## <u>ප්‍රතිලාභ ලබන ආකාරය</u>

1. අරමුදලේ ප්‍රතිලාභ ලැබිය හැක්කේ කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨයේ අභ්‍යන්තරිකව තත්කාලීනව අධ්‍යාපනය ලබන විද්‍යාර්ථියෙකුට සහ/හෝ ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයකුට පමණි.

   පැහැදිලි කිරීම : මෙහි අර්ථය සඳහා ආශ්‍රිතයා යනු, විද්‍යාර්ථියාගේ මව හෝ පියා හෝ භාරකරුවා හෝ පමණක් ලෙස තේරුම් ගත යුතුය.

2. අරමුදලේ ප්‍රතිලාභ මූල්‍යමය ආධාරයක් ලෙසින් පමණක් සිදුකරන අතර ද්‍රව්‍යමය හෝ වාචික හෝ මානසික හෝ වෙනත් කිසිදු ප්‍රතිලාභයක් ලෙසින් නො සැලකිය යුතු ය.

3. මූල්‍යමය ආධාරය බැංකු ගිණුම්ගත ගනුදෙනුවක් ලෙසින් පමණක් සිදුවන අතර ප්‍රතිලාභ ලබන විද්‍යාර්ථියාගේ හෝ ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයාගේ බැංකු ගිණුමකට හෝ ක්‍රියා පටිපාටියට අනුව ඉල්ලා සිටින වෙනත් අයෙකුගේ බැංකු ගිණුමකට හෝ බැර කරනු ලැබේ.

4. ප්‍රතිලාභ බෙහෙර කිරීම හෝ නොකිරීම පිළිබඳ අවසන් තීරණය තුලාව සංසදයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකගේ මඟ පෙන්වීම මත නීති පීඨ පීඨාධිපතිතුමාගේ අනුමැතියට යටත් වන බව සැලකිය යුතුය.

5. අරමුදලේ ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨයේ අභ්‍යන්තරිකව තත්කාලීනව තම ප්‍රථම උපාධිය හදාරනු ලබන සියලුම විද්‍යාර්ථීන් සුදුසුකම් ලබයි. කිසිදු විද්‍යාර්ථියෙකු වෙනත් විද්‍යාර්ථියෙකු නොලබන වරප්‍රසාදයක් අරමුදල පවතින තාක් කල් ඒ ආශ්‍රයෙන් නොලැබිය යුතුය.

6. ප්‍රමුඛතාවය ලබා දීමේ දී පූර්වතාවය පමණක් එකම හේතුව ලෙස සැලකිය යුතුය.

7. ප්‍රතිලාභ ලැබිය හැක්කේ මේ වගන්තිය යටතේ පහත දැක්වෙන අවස්ථාවන්හි දී පමණක් බව සැලකිය යුතුය.

   7.1. විද්‍යාර්ථියෙකු පෙළෙන බරපතල රෝගාබාධයකදී*,
      7.1.1. ඖෂධ මිලදී ගැනීමට
      7.1.2. රෝහල් බිල ගෙවීමට
      7.1.3. ශල්‍යකර්මයක් සඳහා
      7.1.4. පවුලට ආර්ථික ශක්තියක් වීම සඳහා

   7.2. විද්‍යාර්ථියෙකුගේ ආශ්‍රිතයෙකු (ආශ්‍රිතයා යන්න මෙහි 1 වගන්තියේ පැහැදිලි කිරීම අදාළ වේ.) පෙළෙන බරපතල රෝගාබාධයකදී*,
      7.2.1. ඖෂධ මිලදී ගැනීමට
      7.2.2. රෝහල් බිල ගෙවීමට
      7.2.3. ශල්‍යකර්මයක් සඳහා
      7.2.4. පවුලට ආර්ථික ශක්තියක් වීම සඳහා

* පැහැදිලි කිරීම : “බරපතල රෝගාබාධය” යනු තුලාව සංසදයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික හා නීති පීඨයේ පීඨාධිපතිතුමා සෑහීමකට පත්වන පරිදි ලියාපදිංචි විශේෂඥ වෛද්‍යවරයෙකුගේ පිළිගත හැකි අත්සනින් හා නිල මුද්‍රාවෙන් යුක්ත පරීක්ෂණ වාර්තාවකින් බරපතල රෝගාබාධයක් යන්න සනාථ කළ යුතු අතර හදිසි අනතුරකදී වන බරපතල ශාරීරික හෝ මානසික ආබාධයක් ද මේ යටතට ගත හැකිය.

7.3. විද්‍යාර්ථියෙකුගේ සහ/හෝ ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයෙකුගේ මරණයකදී ඔවුන්ගේ පවුලට ආර්ථික ශක්තියක් වීම සඳහා.

8. එක් පවුලකින් එක් අයකුට වඩා නීති පීඨයේ අධ්‍යාපනය ලබන අවස්ථාවකදී එක් අයෙකුගේ ඉල්ලීමක් පමණක් සලකා බලන අතර එකම පවුලේ දෙදෙනා/කීපදෙනා එක් ප්‍රතිලාභයෙකු ලෙස ගණන් ගන්නා බව අවබෝධ කරගත යුතුය.

9. අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන නීති පීඨ විද්‍යාර්ථීන් පහත සඳහන් ලේඛන සමග තම ඉල්ලීම; “සභාපති, තුලාව සංසදය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, රීඩ් මාවත, කොළඹ 07” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් තුලාව සංසදයේ සභාපති වෙත ගෙනැවිත් භාර දිය යුතුය.

**අවශ්‍ය ලේඛන:-**

9.1. ඉල්ලීම කරන විද්‍යාර්ථියාගේ විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය හැඳුනුම්පතේ ඡායා පිටපතක් හෝ ඒ වෙනුවෙන් පිළිගත හැකි ලේඛනයක්

9.2. ඉල්ලීම කරන විද්‍යාර්ථියාගේ ජාතික හැඳුනුම්පතේ/ වලංගු රියදුරු බලපත්‍රයේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්

9.3. ප්‍රතිලාභ අපේක්ෂා කරන්නේ තම ආශ්‍රිතයෙකු වෙනුවෙන් නම් ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පතේ/ වලංගු රියදුරු බලපත්‍රයේ හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්

9.4. නියමිත පරිදි සහතික කරගත් අපි අපිම අරමුදලේ ප්‍රතිලාභ ලැබීමේ අයදුම්පත්‍රය (Fund Receiving Application) (තුලාව සංසදයේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.)

9.5. අයදුම් කරන්නා විසින් ලියන ලද තුලාව සංසදයේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික මගින් නීති පීඨයේ පීඨාධිපතිතුමා වෙත ආමන්ත්‍රණය කළ ඉල්ලීම් ලිපියක් (ලිපියේ ආකෘතිය තුලාව සංසදයේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.)

9.6. මෙහි 7.1 හා 7.2 අවස්ථා යටතේ කරන ඉල්ලීමක් නම් ලියාපදිංචි විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අත්සන හා නිල මුද්‍රාව යොදා සහතික කරන ලද වෛද්‍ය වාර්තා

9.7. මෙහි 7.3 අවස්ථාව යටතේ කරන ඉල්ලීමක් නම් අදාළ පුද්ගලයාගේ මරණ සහතිකය

9.8. ඉල්ලුම්කාර විද්‍යාර්ථියාගේ පවුලේ මාසික ආදායම සඳහන් කරමින් ග්‍රාම නිලධාරීවරයාගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ආදායම් වාර්තාව

10. මෙම නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමේ සම්පූර්ණ බලය තුලාව සංසදයේ විධායක මණ්ඩලය සතු වේ. නමුත් එය තුලාව සංසදයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයාගේ සහ නීති පීඨයේ පීඨාධිපතිතුමාගේ අනුමැතියට යටත් වේ.